**හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව - 2022**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම් මිනුම් කිරීම සහ පිඹුරු පත් සකස් කිරීම සඳහා වැය කර තිබුණු රු.540,000 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී හල්දුම්මුල්ල මහජන පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.93,730 ක් වටිනා පුස්තකාල පොත් 110 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | ඉකුත් වර්ෂවලදී ඇස්තමේන්තු සකස් කර ඉටු කර නොතිබුණු ව්‍යාපෘති 48 ක් වෙනුවෙන් රු.9,753,707 ක් ණයහිමි ලෙස ගිණුම්ගත කර තිබුණි. | කර්මාන්ත 9 ක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී. කර්මාන්ත 3 ක ණය හිමි ශේෂ 2023 වර්ෂයේ ගිණුම්වලින් ඉවත් කරන බව. | -එම- |
| (ඈ) | කැබ් රථය අනතුරට පත්වීම වෙනුවෙන් ඉකුත් වර්ෂයේදී රක්ෂණ සංස්ථාවෙන් ප්‍රාදේශීය සභාවට තවදුරටත් ලැබිය යුතු රු.102,849 ක් ලැබිය යුතු රක්ෂණ වන්දි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම්වලින් ඉවත් කරන බව. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී වැඩ නිම කර තිබුණු කසළ අංගනයේ කසළ රැස්කිරීමේ ගබඩා කාමරයේ නිමි වැඩ වටිනාකම රු.1,892,539 ක් වුවද, දේපල පිරියත උපකරණ යටතේ රු.1,564,439 ලෙස ගිණුම් ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහයක (LDSP) ව්‍යාපෘතිය මඟින් ආධාර ලෙස ලැබී වැය කර තිබුණු රු.11,985,044 ක් ප්‍රාග්ධන ආදායම් සහ ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | -එම- | -එම- |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (ඇ) | ඉකුත් වර්ෂ වලදී ප්‍රාදේශීය සභාව විසින් රු.728,165 ක හිඟ කඩ කුලී වෙනුවෙන් ගොනුකර තිබුණු නඩු 4 ක් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | ඉදිරියේදී නඩු කටයුතු පිළිබඳ විස්තර ගිණුම තුළ ඇතුළත් කරන බව. | අසම්භාවය බැරකම් පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ අනාවරණය කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හිඟහිටි මුද්දර ගාස්තු ශේෂය හා උපලේඛනයේ හිඟ හිටි මුද්දර ගාස්තු ශේෂය අතර රු.2,388,963 ක වෙනසක් විය. | 2023 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී නිවැරදි කරන බව. | උප ලේඛන හා ගිණුම්වල ශේෂ සැසඳෙන පරිදි නිවැරදි කළ යුතුය. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 23,855,567 ක වත්කම් හා වගකීම් විෂයයන් 05 කට අදාළව ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන, තැන්පතු සහතික සහ තොග සමීක්ෂණ වාර්ථා ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | 2023 වර්ෂයේ ලේඛන හා උප ලේඛන ඉදිරිපත් කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | ඉකුත්වර්ෂවල අවස්ථා 04කදී ලබාදී තිබුණු රු.628,788 ක් සහ සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 10 කට අදාළව ලබාදී තිබුණු අත්තිකාරම් රු.194,300 ක් පියවා නොතිබුණි | අත්තිකාරම් වලින් කොටසක් පියවා ඇත. අනෙකුත් අත්තිකාරම් සම්බන්ධව ඉදිරියේදී ක්‍රියාමාර්ග ගන්නා බව. | ලබා ගන්නා අත්තිකාරම් අදාළ කාර්ය නිමවූ වහාම පියවීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරනලද මූල්‍ය ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,196,570 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,771,925 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 2,759,810 | 3,238,446 | 2,009,918 | 1,228,528 | 2,842,689 | 2,674,657 | 1,906,778 | 767,879 |
| (ii) | කුලී | 2,619,900 | 2,691,367 | 2,254,307 | 437,060 | 2,346,400 | 2,630,867 | 2,243,713 | 387,154 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 781,350 | 1,215,506 | 1,215,506 | 0 | 662,400 | 674,501 | 674,501 | - |
| | එකතුව | 6,161,060 | 7,145,319 | 5,479,731 | 1,665,588 | 5,851,489 | 5,980,025 | 4,824,992 | 1,155,033 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල් කරන ලද රු.7,145,319 ක් වු මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු.1,665,588 අයකර නොතිබුණු අතර, එය මුළු බිල් කළ ආදායමෙන් සියයට 23 ක ප්‍රතිශතයක් විය. | රටේ පැවති අර්බුදකාරී තත්වය ඊට හේතු වූ බවත් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවට අයත් උඩ විහාරගල නැරඹුම් මැදිරිය සහ එහි වැසිකිලිය සම්බන්ධයෙන් 2019, 2020 සහ 2021 වර්ෂ සඳහා 2019 පෙබරවාරි 06 දින බදු ගිවිසුමකට එළඹ බාහිර පාර්ශවයකට බදුදී තිබුණි. බදු ගිවිසුම අනුව හිඟ බදු මුදල වූ රු.309,276 ක් අයකරගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නඩු පවරා ඇති බව. | හිඟ බදු මුදල් අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවට අයත් ආදාහනාගාරයේ කටයුතු 2021 මාර්තු 06 දින ආරම්භ කර තිබුණු නමුත් විගණිත දිනය වන 2023 මාර්තු 29 දින වනවිටත් ඒ සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගැනීමට කටයුතු කරන බව. | ආදාහනාගාරය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ලබා ගත යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2015 මාර්තු 31 දින සභා අරමුදල් යටතේ කිතුලගහඅරාව ග්‍රාමීය සංවිධානයට බෝක්කුවක් ඉදිකිරීමට සහ පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘතියකට පිළිවෙලින් රු.10,000 ක් සහ රු.100,000 ක අත්තිකාරම් ලබාදී තිබුණද කර්මාන්ත ඉටු කර නොතිබු අතර, අත්තිකාරම්ද පියවා නොතිබුණි. | මෙම මුදල පියවන ලෙස අදාළ සමිතියට දැනුම් දුන් නමුත් මෙතෙක් ගෙවීම් කර නොමැති බව. | අත්තිකාරම් ලබා ගත් කාර්යයන් ඉටු කිරීමට හෝ අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | 2020 මැයි මස 28 වන දින අනතුරුට පත්වී තිබුණු ප්‍රාදේශීය සභාවට අයත් කැබ්රථය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අවසන් වාර්තාවට අනුව එහි අලාභය වූ රු.488,000 ක් සහ ඉන් සියයට 25 ක් වන රජයේ ගාස්තුද සභාපතිවරයාගෙන් අයකර ගැනීමේ නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර ඇති බව. | පරීක්ෂණ මණ්ඩල නිරිදේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) | 1982 නොවැම්බර් 08 දින ප්‍රාදේශිය සභාවේ කොස්ලන්ද උප කාර්යාලයට අයත් නිවාසයක් බදු ගිවිසුමකට එළඹ ප්‍රාදේශිය සභාවේ සේවකයකුට ලබා දී තිබුණු අතර, 1984 ජනවාරි 01 දින එම නිලධාරියා විශ්‍රාම ගොස් තිබුණි. එසේ වුවද විගණන දිනය වූ 2023 මාර්තු 29 දින වන විටත් අදාළ නිවාසය ප්‍රාදේශීය සභාවට නැවත පවරාගෙන නොතිබුණි. | රජයේ නිල නිවාස සන්තකය ආපසු ගැනීමේ පනත යටතේ නෛතික ක්‍රියාමාර්ග ගන්නා බව. | සභාවේ දේපළ ආරක්ෂාව තහවුරු කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2012 අගෝස්තු 24 දිනැති අංක 1773 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ 4 (ආ) කොටසේ ප්‍රසිද්ධ කර ඇති පරිදි දෙස් විදෙස් සංචාරකයන්ගේ ආකර්ශනයට ලක් වූ බෙරගල මංසන්දියේ සිට උඩ විහාරගල දක්වා වූ දර්ශන පථය අවහිරවන ලෙස ඉදිකර තිබුණු අනවසර ජංගම වෙළඳකුටි 2023 මාර්තු 29 විගණන දිනය දක්වාම ඉවත් කර නොතිබුණි. | අනවසර ජංගම වෙළදාම් කුටි ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරන බව. | මහජනතාවට පීඩාවන ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාවට අයත් කසළ අංගනයේ කසළ ගබඩා කිරීමේ කාමරයේ ඉදිකිරීම් කර්මාන්තයේ අවසන් ගෙවීමට අදාළ මැනුම් පත්‍රයේ අයිතම අංක 08 අනුව ජනේල සහ දොරවල් සඳහා පිත්තල සරනේරු සහ උපාංග සවි කළ යුතු වුවද, ඒ සඳහා යකඩ සරනේරු සහ උපාංග සවිකර තිබුණු බව එහි සිදු කල භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව අනුමත පිරිවිතරවලට අනුකූල නොවන අයිතමය සඳහා රු.149,627 ක් සභා අරමුදලින් ගෙවා තිබුණි. | කසළ ගබඩා කිරීමේ කාමරයේ ජනේල සහ දොරවල් සඳහා පිත්තල සරනේරු සහ උපාංග සවි කරන ලෙස අදාළ සමිතිය දැනුවත් කර ඇති බව. | අවසන් බිල්පතේ ගෙවීම් කර ඇති පරිදි කර්මාන්තයේ වැඩ නිම කර තිබිය යුතුය. |